# 6 ශ්‍රේණිය ගණිතය

## 05 ඒකකය – 2022

# සංඛ්‍යා රේඛාව



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 5. සංඛ්‍යා රේඛාව

## 5.1 සංඛ්‍යා රේඛාව මත පූර්ණ සංඛ්‍යා සලකුණු කිරීම


- සංඛ්‍යා නිරූපණය කිරීම සඳහා යොදා ගන්නා රේඛාවක් සංඛ්‍යා රේඛාව යන නමින් හඳුන්වනු ලැබේ.
- සංඛ්‍යා රේඛාවෙහි දකුණු පස කෙළවරට ඊ හිසක් යොදයි.
- සංඛ්‍යා රේඛාවක, සංඛ්‍යාවල අගය දකුණු දෙසට ක්‍රමයෙන් වැඩි වේ.
- පහත ආකාරයට සංඛ්‍යා රේඛාවක, සංඛ්‍යාවක් සලකුණු කර පෙන්විය හැකි ය. එම සංඛ්‍යා රේඛාව මත එක ළඟ පිහිටි පූර්ණ සංඛ්‍යා දෙකක් අතර වෙනස 1කි. වෙනස එකක් වූ පූර්ණ සංඛ්‍යා දෙකක් අනුයාත (එක ළඟ පිහිටි) පූර්ණ සංඛ්‍යා දෙකක් යනුවෙන් හැඳින්වේ.





✓ පෑනෙහි දිග, පැන්සලේ දිගට වඩා වැඩි ය.
✓ මකනයේ දිග, පෑනෙහි දිගට වඩා අඩු ය.
✓ පැන්සලේ දිග, මකනයේ දිගට වඩා ඒකක 3කින් වැඩි ය.

**5.1 අභ්‍යාසය**

(1) පහත දී ඇති සංඛ්‍යා රේඛාව පිටපත් කර ගන්න. එය මත 1, 2 සහ 5 යන සංඛ්‍යා සලකුණු කරන්න.





(2) පහත දක්වා ඇති සංඛ්‍යා රේඛාව මත සලකුණු කර ඇති සංඛ්‍යා ලියා දක්වන්න.





## 5.1 අභ්‍යාසය

1.




2. 0, 2 සහ 3

(3) සංඛ්‍යා රේඛාවේ ඇති විශේෂ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.
(4) සංඛ්‍යා රේඛාවක් මත 4, 7 සහ 2 යන සංඛ්‍යා සලකුණු කරන්න.
(5) නිමල්ගේ වයස අවුරුදු 8කි. ඔහුගේ නැගණියගේ වයස අවුරුදු 5කි. සංඛ්‍යා රේඛාව මත මෙම අගයන් සලකුණු කර දක්වන්න.
(6) පහත සංඛ්‍යා රේඛාවේ සලකුණු කර ඇති සංඛ්‍යා ලියන්න.





(7) පහත සංඛ්‍යා රේඛාවේ ගීතාගේ හා නිමල්ගේ දැන් වයස අවුරුදුවලින් දක්වා ඇත.





(i) ගීතා හා නිමල් අතුරින් වැඩිමහල් වන්නේ කවුරුන් ද?
(ii) ගීතාගේ දැන් වයස කීය ද?
(iii) ගීතාගේ වයස අවුරුදු 10 වන විට නිමල්ගේ වයස කීය ද?

3.
✓ සංඛ්‍යා රේඛාවෙහි දකුණු පස කෙළවරට ඊ හිසක් යොදයි.
✓ සංඛ්‍යා රේඛාවක, සංඛ්‍යාවල අගය දකුණු දෙසට ක්‍රමයෙන් වැඩි වේ.

4.




5.




6. 15 සහ 20

7.
I. නිමල්.
II. අවුරුදු 8යි.
III. අවුරුදු 17යි.

## 5.2 සෘණ සංඛ්‍යා

- සංඛ්‍යා රේඛාවක බින්දුවෙන් දකුණු අත ඇති පූර්ණ සංඛ්‍යා **ධන නිඛිල** ලෙස හැඳින්වේ. එනම්, ධන නිඛිල 1, 2, 3, 4, ... ආදි වශයෙන් වේ. සංඛ්‍යා අගට යොදා ඇති තිත් තුනෙන් සංඛ්‍යා මෙලෙස තවදුරටත් තිබෙන බව නිරූපණය කර ඇත.

- සංඛ්‍යා රේඛාවක බින්දුවෙන් වම් පස ඇති සෘණ පූර්ණ සංඛ්‍යා **සෘණ නිඛිල** ලෙස හැඳින්වේ. එනම්, සෘණ නිඛිල -1, -2, -3, ... ආදි වශයෙන් වේ. සංඛ්‍යා මුලට යොදා ඇති තිත් තුනෙන් සංඛ්‍යා මෙලෙස තවදුරටත් තිබෙන බව නිරූපණය කර ඇත.


- බින්දුව, ධන හෝ සෘණ හෝ නොවන සංඛ්‍යාවකි. ධන නිඛිල ද, සෘණ නිඛිල ද, බින්දුව ද ඇතුළත් සංඛ්‍යා සියල්ල **නිඛිල** නමින් හැඳින්වේ. එනම්, ..., -3, -2, -1, 0, 1, 2, 3, ... නිඛිල වේ.

- සෘණ සංඛ්‍යා ඇතුළත් සංඛ්‍යා රේඛාවෙහි ද දකුණු පස කෙළවරට ඊ හිසක් යොදනු ලැබේ. නමුත් සංඛ්‍යා රේඛාවෙහි, දෙපසට ම ඊ හිස් යොදන අවස්ථා ද දැකිය හැකි ය. තව ද, ඊ හිසවල් දෙපසට ම නොයෙදෙන අවස්ථා ද දැකිය හැකි ය.


- සෘණ සංඛ්‍යා භාවිත කරන අවස්ථා බොහෝ ඇත. උදා:-
  - ✓ උෂ්ණත්වය, සෙල්සියස් අංශක බින්දුවට වඩා පහළ බසින අවස්ථා.
  - ✓ ජලාශයක ජල මට්ටම සාමාන්‍ය අගයට වඩා පහළ බසින අවස්ථා.

### 5.2 අභ්‍යාසය

(1) පහත දී ඇති සංඛ්‍යා රේඛාවේ සලකුණු කර ඇති සංඛ්‍යා ලියන්න.




(2) පහත දී ඇති සංඛ්‍යා රේඛාවේ $P$, $Q$ සහ $R$ මගින් නිරූපණය වන අගයන් ලියා දක්වන්න.




$P$ මගින් නිරූපණය වන අගය = ..............................

$Q$ මගින් නිරූපණය වන අගය = ..............................


$R$ මගින් නිරූපණය වන අගය = ..............................

## 5.2 අභ්‍යාසය

1. -5, -3 සහ 2


2. P මගින් නිරූපණය වන අගය 1
Q මගින් නිරූපණය වන අගය 3
R මගින් නිරූපණය වන අගය -2

(3) පහත දී ඇති සංඛ්‍යා රේඛාව පිටපත් කරගෙන 4, 1 සහ –3 සංඛ්‍යා එය මත සලකුණු කරන්න.





(4) –5 සිට 5 දක්වා නිඛිල දැක්වෙන සංඛ්‍යා රේඛාවක් ඇඳ, ඒ මත 4, –4 සහ –1 සංඛ්‍යා සලකුණු කරන්න. එම ස්ථාන පිළිවෙළින් *A*, *B* සහ *C* ලෙස නම් කරන්න.

3.




4.




## 5.3 නිඛිල සංසන්දනය

- නිඛිල දෙකක් සංසන්දනය කිරීමේ දී, මෙම සංකේත යොදා ගත යුත්තේ පහත දැක්වෙන පරිදි ය.

  ✓ විශාල නිඛිලය > කුඩා නිඛිලය
  ✓ කුඩා නිඛිලය < විශාල නිඛිලය

- මෙහි “>”සහ “<” යන සංකේතවලට අසමානතා ලකුණු යැයි කියනු ලබන අතර එම සංකේතවල තුඩ නෙරා ඇත්තේ කුඩා සංඛ්‍යාව දෙසට වේ. උදා:-

  ✓ 5 > 2 - පහ, දෙකට වඩා විශාල වේ.
  ✓ 4 < 9 - 4, 9ට වඩා කුඩා වේ.

## 5.3 අභ්‍යාසය

(1) අසමානතා ලකුණු භාවිතයෙන් නිඛිල දෙකක් සංසන්දනය කර, පහත දක්වා ඇත. එම එක් එක් අවස්ථාව, වචනයෙන් විස්තර වන ආකාරය ලියන්න.

| | අසමානතාව | වචනයෙන් විස්තර වන ආකාරය |
|---|---|---|
| (i) | $6 > 2$ | හය, දෙකට වඩා විශාල වේ. |
| (ii) | $25 > 12$ | |
| (iii) | $4 > 0$ | |
| (iv) | $0 < 7$ | |
| (v) | $15 < 50$ | |
| (vi) | $0 > -3$ | |
| (vii) | $-1 > -8$ | |
| (viii) | $-6 < -2$ | |

## 5.2 අභ්‍යාසය

**1.**

I. හය, දෙකට වඩා විශාල වේ.
II. විසිපහ, දොළහට වඩා විශාල වේ.
III. හතර, බිංදුවට වඩා විශාල වේ.
IV. බිංදුව, හතට වඩා කුඩා වේ.
V. පහළොව, පනහට වඩා කුඩා වේ.
VI. බිංදුව, ඍණ තුනට වඩා විශාල වේ.
VII. ඍණ එක, ඍණ අටට වඩා විශාල වේ.
VIII. ඍණ හය, ඍණ දෙකට වඩා කුඩා වේ.

(2) පහත, දී ඇති සම්බන්ධතා හරි ද වැරදි ද යන්න ලියන්න.


(i) $-5 > -8$ (ii) $-3 < 2$ (iii) $-7 > 0$
(iv) $-2 = 2$ (v) $8 < -9$ (vi) $6 < -4$

**2.**

I. හරි.
II. හරි.
III. වැරදි.
IV. වැරදි.
V. වැරදි.
VI. වැරදි.

## 5.4 නිඛිල සංසන්දනය තවදුරටත්

- නිඛිල දෙකකට වඩා සංසන්දනය කරන අවස්ථාවක දී ද සංඛ්‍යා රේඛාව පහසුවෙන් යොදා ගත හැකි ය.




✓ සංඛ්‍යා රේඛාවෙහි වම් පස සිට දකුණු පසට සංඛ්‍යාවන්හි අගය ක්‍රමයෙන් වැඩි වේ. එම නිසා, ඉහත සංඛ්‍යා ක්‍රමයෙන් අගය වැඩි වන සේ ලියූ විට -5, -4, -3, -2, -1, 0, 1, 2, 3, 4, 5 වේ.

✓ මේ ආකාරයට සංඛ්‍යා අගය වැඩි වන ආකාරයට ලියා දැක්වීම, එම සංඛ්‍යාවල **ආරෝහණ පටිපාටිය** ලෙස හැඳින්වේ.

✓ සංඛ්‍යා රේඛාවෙහි දකුණු පස සිට වම් පසට සංඛ්‍යාවන්හි අගය ක්‍රමයෙන් අඩු වේ. එම නිසා, ඉහත සංඛ්‍යා ක්‍රමයෙන් අගය අඩු වන සේ ලියූ විට 5, 4, 3, 2, 1, 0, -1, -2, -3, -4, -5 වේ.

✓ මේ ආකාරයට සංඛ්‍යා අගය අඩු වන ආකාරයට ලියා දැක්වීම, එම සංඛ්‍යාවල **අවරෝහණ පටිපාටිය** ලෙස හැඳින්වේ.

**5.4 අභ්‍යාසය**

(1) පහත දී ඇති සංඛ්‍යා රේඛාව මත සලකුණු කර ඇති සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.




(2) සංඛ්‍යා රේඛාව භාවිතයෙන්, දී ඇති නිඛිල අවරෝහණ පටිපාටියට ලියන්න.

−4, 0, −2, 2


(3) සංඛ්‍යා රේඛාව භාවිතයෙන්, දී ඇති නිඛිල ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

0, −1, 2, −4, −2

## 5.4 අභ්‍යාසය

1. -2, 1, 4
2. 2, 0, -2, -4
3. -4, -2, -1, 0, 2

(4) ළමයින් තිදෙනකුගේ වයස අවුරුදුවලින් නිරූපණය කළ, පහත දැක්වෙන සංඛ්‍යා රේඛාව සලකන්න. ඒ අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





(i) ළමයින්ගේ වයස අවරෝහණ පටිපාටියට ලියා දක්වන්න.
(ii) ළමයින්ගේ නම්, වයස අඩු වන පිළිවෙළට ලියා දක්වන්න.
(iii) වැඩිමහල් ම ළමයා කවුද? බාල ම ළමයා කවුද?

**4.**

I. 7, 5, 2
II. රාණි, සීතා, මීනා
III. වැඩිමහල් ම ළමයා - රාණි
බාල ම ළමයා - මීනා

(5) එක්තරා දිනක ලෝකයේ නගර කිහිපයක උෂ්ණත්වයන් පහත දැක්වෙන සංඛ්‍යා රේඛාවේ සෙල්සියස් අංශකවලින් සලකුණු කර ඇත.





(i) අඩු ම උෂ්ණත්වය තිබූ නගරය කුමක් ද?
(ii) වැඩි ම උෂ්ණත්වය තිබූ නගරය කුමක් ද?
(iii) පීකිං නගරයේ උෂ්ණත්වය, නව දිල්ලියේ උෂ්ණත්වයට වඩා ඒකක කීයක් අඩු ද?
(iv) නවදිල්ලි හා පීකිං අතර ද නව දිල්ලි හා මෙල්බර්න් අතර ද උෂ්ණත්වවල වෙනස සැලකූ විට වැඩි වෙනස ඇත්තේ කුමන නගර දෙක අතර ද?

**5.**

I. පීකිං
II. මෙල්බර්න්
III. ඒකක 5ක්
IV. නවදිල්ලි හා පීකිං අතර

## 5.5 අනුයාත නොවන නිඛිල දෙකක් අතර නිඛිලයන් සෙවීම

- නිඛිල යුගලයක් අතර පවතින නිඛිල සියල්ල ලියා දක්වන අවස්ථාවක දී ද සංඛ්‍යා රේඛාව පහසුවෙන් යොදා ගත හැකි ය.




✓ - 4 සහ 1 අතර ඇති සියලු නිඛිල = - 3, - 2, - 1, 0 වේ.
✓ - 1 සහ - 5 අතර ඇති සියලු නිඛිල = - 2, - 3, - 4 වේ.
✓ - 3 සහ 3 අතර ඇති සියලු නිඛිල = - 2, - 1, 0, 1, 2 වේ.
✓ 0 සහ - 5 අතර ඇති සියලු නිඛිල = - 1, - 2, - 3, - 4 වේ.

**5.5 අභ්‍යාසය**

(1) 2 සහ 8 අතර ඇති නිඛිල සියල්ල ලියා දක්වන්න.

(2) 5 සහ 13 අතර ඇති විශාලතම නිඛිලය හා කුඩාතම නිඛිලය ලියා දක්වන්න.

(3) – 4 සහ 4 අතර ඇති නිඛිල සියල්ල ලියා දක්වන්න.

(4) – 10 සහ – 2 අතර පවතින නිඛිල සියල්ල ලියා දක්වන්න.

(5) 2 සහ – 5 අතර ඇති නිඛිල සියල්ල ආරෝහණ පටිපාටියට ලියන්න.

### 5.5 අභ්‍යාසය

1. 3, 4, 5, 6, 7

2. විශාලතම නිඛිලය = 12
   කුඩාතම නිඛිලය = 6

3. - 3, - 2, - 2, 0, 1, 2, 3


4. - 9, - 8, - 7, - 6, - 5, - 4, - 3

5. - 4, - 3, - 2, - 1, 0, 1

## මිශ්‍ර අභ්‍යාසය

(1) සුදුසු සංඛ්‍යා රේඛාවක් මත 5, −3 සහ −2 සලකුණු කර දක්වන්න. ඒවා ආරෝහණ පටිපාටියට ලියන්න.

(2)





සංඛ්‍යා රේඛාවෙහි $P$, $Q$ සහ $R$ මගින් නිරූපණය වන සංඛ්‍යා ලියා දක්වන්න.

(3) සංඛ්‍යා රේඛාවක් ඇසුරු කර ගනිමින්, පහත දී ඇති අගයන් ආරෝහණ පිළිවෙළින් ලියා දක්වන්න.

3, 0, −1, − 4

## මිශ්‍ර අභ්‍යාසය

1.




**ආරෝහණ පටිපාටිය = - 3, - 2, 5**

2. **P = 1, Q = 4, R = 6**

3. **- 4, - 1, 0, 3**

(4) සංඛ්‍යා රේඛාවක −6, −2, −1, 0, 1, 3, 5 යන සංඛ්‍යා සලකුණු කරන්න.


(i) සලකුණු කළ සංඛ්‍යාවලින් විශාලතම නිඛිලය කුමක් ද? කුඩාතම නිඛිලය කුමක් ද?

(ii) $<$ හෝ $>$ අසමානතා ලකුණ නිවැරදි ව යොදමින් පහත හිස්තැන් පුරවන්න.

(a) − 6 ....... 3 (b) − 2 ....... − 1 (c) 0 ....... − 2

(d) 5 ....... − 1 (e) − 1 ....... − 6

**4.**




I. විශාලතම නිඛිලය = 5

කුඩාතම නිඛිලය = - 6

II. (a) - 6 < 3 (b) - 2 < - 1 (c) 0 > - 2

(d) 5 > - 1 (e) - 1 > - 6

(iii) – 6 සහ 5 අතර ඇති සියලුම නිඛිල අවරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

(iv) – 1 හා 1 අතර නිඛිල කීයක් තිබේ ද?

(v) 0 හා 5 අතර සෘණ නිඛිල තිබේ ද?

(vi) – 6 හා 0 අතර ධන නිඛිල තිබේ ද?

(vii) – 1 හා 1 අතර ධන හෝ සෘණ හෝ නිඛිල තිබේ ද?

III. - 5, -4, -3, -2, -1, 0, 1, 2, 3, 4

IV. 1යි.

V. 4යි.

VI. නැත.

VII. නැත.

## සාරාංශය

- ✓ සමාන පරතර සහිත ව දකුණු පසට ක්‍රමයෙන් අගය වැඩි වන සේ සංඛ්‍යා නිරූපණය කර ඇති පහත ආකාරයේ රේඛාවක් සංඛ්‍යා රේඛාව නම් වේ.
- ✓ සංඛ්‍යා රේඛාවෙහි බින්දුවෙන් වම් පස ඇති සංඛ්‍යා සෘණ සංඛ්‍යා වේ.
- ✓ …, -3, -2, -1, 0, 1, 2, 3, … යන සංඛ්‍යා නිඛිල වේ. බින්දුව ධන හෝ සෘණ හෝ නොවන නිඛිලයකි.
- ✓ නිඛිල යුගලක් සංසන්දනයේ දී වඩා විශාල බව දැක්වීමට “>”සංකේතය ද වඩා කුඩා බව දැක්වීමට “<” සංකේතය ද යොදා ගනී.
- ✓ සංඛ්‍යා රේඛාවක් මත වූ සංඛ්‍යා දෙකක් සැසඳීමේ දී, සෑම විට ම එහි දකුණත් පසින් ඇති සංඛ්‍යාව වමත් පසින් ඇති සංඛ්‍යාවට වඩා විශාල ය.
- ✓ සංඛ්‍යා රේඛාව ඇසුරෙන් අනුයාත නොවන නිඛිල දෙකක් අතර ඇති නිඛිල පහසුවෙන් හඳුනාගත හැකි ය.


NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10** NALANDA VIDYALAYA

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය** NALANDA VIDYALAYA

| | | |
|---|---|---|
| **6 ශ්‍රේණිය** | ගණිතය | ඒකකය: 5- **සංඛ්‍යා රේඛාව** |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පහත සඳහන් ද්‍රව්‍යවල බර සංඛ්‍යා රේඛාවේ ලකුණු කරන්න.




A – මාගරින් පැකට්ටුවක බර 100 g B = පාන් කාලක බර 125 g


C – ජෑම් බෝතලයක බර 350 g D = තේකොළ පැකට්ටුවක බර 300 g

2) කමල්ගේ වයස - අවු. 10

ගීතාගේ වයස - අවු. 25

නිමල්ගේ වයස - අවු. 40

මෙම තොරතුරු පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න. ඒ අනුව වයසින් වැඩිම තැනැත්තාත් වයසින් අඩුම තැනැත්තාත් නම් කරන්න.




3) ඉහත තිදෙනාගේ වයස අනුව > යොදා සැසඳීම් 3ක් ලියන්න.

4) වරහන තුළ දී ඇති සංඛ්‍යා අතුරින් හිස්තැනට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

i) ____ > 8 (3, 9, 8)

ii) ____ > 6 (2, 6, 7)

iii) 2 < _____ (0, 2, 5)

iv) _____ > 25 (1, 27, 23)

5) පහත අසමානතා වචනයෙන් ලියා දක්වන්න.


i) 6 > 2 -

ii) 25 > 12 -

iii) 0 < 5 -

iv) 7 > 3 -

6)




i) ඉහත සංඛ්‍යා රේඛාව මත 3, 5, 7 ලකුණු කර දක්වන්න.

ii) ඉහත සංඛ්‍යා රේඛාව මත ම -5, -3, -1 ලකුණු කර දක්වන්න.

iii) ඒ ඇසුරෙන් දී ඇති සංඛ්‍යා සඳහා > හෝ < යොදන්න.

7 ______ 5 -5 _______ 7

5 ______ 3 5 _______ -3

-1 ______ -3 3 _______ -3

-3 ______ -5 0 _______ 8

iv) ඉහත ලකුණු කරන ලද සංඛ්‍යා 6 ම ආරෝහණ පටිපාටියට ලියන්න.

v) ඉහත ඇඳ ඇති සංඛ්‍යා රේඛාවේ -5 හා +5 අතර ඇති

අ) ධන නිඛිල මොනවා ද?

ආ) සෘණ නිඛිල මොනවා ද?

vi) සංකේත මගින් ලියන්න.

අට දෙකට වඩා විශාල වේ. -

සෘණ තුන අටට වඩා කුඩා වේ. -

සෘණ පහ සෘණ දහයට වඩා විශාල වේ. -


*සැකසුම : නයනා අසෝකා මිය*

# පිළිතුරු




Answer

1.




2.




වයසින් වැඩිම තැනැත්තා - නිමල්
වයසින් අඩුම තැනැත්තා - කමල්

3. නිමල් > ගීතා > කමල්

4.


I. 9 > 8
II. 7 > 6
III. 2 < 5
IV. 27 > 25

5.

I. හය, දෙකට වඩා විශාල වේ.
II. විසිපහ, දොළහට වඩා විශාල වේ.
III. බිංදුව, පහට වඩා කුඩා වේ.
IV. හත, තුනට වඩා විශාල වේ.

6.

I. -
II. -




III. 7 > 5    -5 < 7    5 > 3    5 > -3
-1 > -3    3 > -3    -3 > -5    0 < 8

IV. -5, -3, -1, 3, 5, 7

V. අ) 3, 5, 7    ආ) -5, -3, -1

VI. 8 > 2,    -3 < 8,    -5 > -10

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


ඔබට අවශ්‍ය සියළුම Past Papers, Model Papers, Term test Papers, Short notes Text Book, Teacher's Guide ආදී සියළුම දේ නොමිලේ ලබා ගැනීමට www.pastpaperszone.lk අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ